# ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

# වැවල - හොරණ

## <u>අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>

මෙම මණ්ඩපයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලබා ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල දැනට **ස්ථිර සේවයේ නියුතු තනතුරෙහි තහවුරු කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ එවා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කර ගත් අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම් / ලේඛකාධිකාරී / අධ්‍යක්ෂ/ මණ්ඩපාධිපති මගින් 2026.09.11 දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන්** **<u>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, වැවල, හොරණ</u>** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.

අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සලකා බලනු නොලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දින වනවිට පහත දැක්වෙන ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතිකවල ඡායා පිටපත් අමුණා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. <u>කළමනාකරණ සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය</u>

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයන් වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් එක් වරකදී සමත්වී තිබීම.
    - (i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
    - (ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
    - (iii) ගණිතය
2. අ.පො.ස. (උසස් පෙළ) විභාගය එක වරකදී සියළු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්ණ පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(a) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) ක පළපුරුද්දක් තිබීම.

<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>

(a) නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයකින් හෝ තාක්ෂණික විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍රය හෝ පිළිගත් ආයතනයකින් පිරිනමනු ඒ හා සමාන සුදුසුකමක් තිබීම.

හෝ

(b) අ.පො.ස. (උසස් පෙළ) විභාගය වානිජ්‍ය විෂය ධාරාවෙන් සමත් වීම.

**වැටුප් පරිමාණය : U – MN1(III ) - රු.49,475–17x540- 58,655/- මාසික**

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මගින්

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය

- Knowledge in Sinhala / Tamil & English Language
- Intelligent quotient and General knowledge
- Computer Literacy
- Relevant Subject area

## 02. <u>තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය</u>

**සුදුසුකම් :**

(a) අ.පො.ස. (සා/ පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 05 ක් සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබීම. සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.

හෝ

(b) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06 කින් සමත් වී තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 08 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම.

හෝ

(c) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායකයෙකු වශයෙන් වසර 15 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.

**සටහන :-** බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව " පුහුණුවන තාක්ෂණික නිළධාරි" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත් සේවක හවතුන් තනතුරෙහි තහවුරු කර II ශ්‍රේණිය " ආ " ඛණ්ඩයේ තාක්ෂණික නිලධාරි තනතුරට පත් කරනු ලැබේ.

**වැටුප් පරිමාණය : UMT 1 (III) - රු.51,095-7X540;10X640-60,575(මාසික)**

**බඳවා ගැනීම :** යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 03. <u>විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)</u>

**සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබීම.

සහ

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකමේ NVQ 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ii) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, කර්මාන්ත කුසලතා සහිත, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය: U-PL 2 (III) රු.44, 575 - 16 x 490 - 52,415 (මාසික)**

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 04. <u>විදුලි කාර්මික III ශ්‍රේණිය</u>

**සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2 ) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර ඇති හා විදුලි කාර්මික තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර ඇති හා විදුලි කාර්මික ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද සමඟ විදුලි කාර්මික තනතුරට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 2 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා ඇති බව වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

වැටුප් පරිමාණය: **U PL 3 (III) - රු.48,005 – 16x490 – 55,845 (මාසික)**

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ශ්‍රී පාලි මණ්ඩපය,
වැවල, හොරණ.
18.08.2026